**ශීර්ෂය 206 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූලි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.1 සහ 1.6.2 (අ) නිරීක්ෂණ සම්බන්ධයෙන් ඡේදවල ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වාර්තාව මගින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 8.2 ඡේදය ප්‍රකාරව තවදුරටත් වාර්තා කළයුතු මූල්‍ය නොවන වත්කම් තිබේ නම් ඒවා නිසිපරිදි හඳුනාගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනාගත නොහැකි නම් තක්සේරු කළ අගයට ගිණුම් ගතකළ යුතු අතර වසර 2020 වන විට සියලුම මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කර අවසන් කල යුතු වුවත් දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි 05 ක්, පිරිවැය රු.53,400,000 ක්වූ වාහන 14 ක්, වටිනාකම සඳහන් නොවූ වාහන 11 ක් සහ හෙක්ටයාර 3.7371 ක් වූ ඉඩම් 05 ක් 2020 දෙසැම්බර් 31 වනවිටද ගිණුම්ගත කර නොතිබුණි. | චක්‍රලේඛ අංක 267/2018 හි පොදු උපදෙස් 8 (8:1) හා (8:2) ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් සිගාස් වැඩසටහන හරහා පවත්වාගෙන යාම ප්‍රමාණවත් බව දන්වා ඇති බැවින් මෘදු පිටපත ලබා දීමට කටයුතු කර ඇත. | අදාල චක්‍රලේඛයේ 8.2 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අයත් සියලු මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන පිරිවැය හෝ තක්සේරු වටිනාකම මත ගිණුම්ගත කල යුතු වේ. |

### 1.6.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමෙහි හර ශේෂය සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව හර ශේෂය අතර | 2004 ට පෙර සිට පැවතෙන මෙම වෙනසට හේතු අනාවරණය කර ගෙන ගිණුම් ගැලපීමට කටයුතු කරමි. | අත්තිකාරම් පාලන ගිණුම හා භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව ශේෂයේ වෙනසක් තිබේනම් එම වෙනස |

| | | | |
|---|---|---|---|
| | රු.444,761 ක වෙනසක් පැවතුණු අතර 2004 වර්ෂයට පෙර සිට පැවත එන මෙම වෙනස හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | | හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කල යුතු වේ. |
| (ආ) | ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ රු.23,500ක් අත්තිකාරම් ගිණුමට ගෙන නොතිබුණි. | අදාල ණය ශේෂය වන රු.23,500 පියවා ඇති බවට අනුමාන කරන අතර එය තහවුරු කර ගත් පසු නිවැරදි කිරීමට කටයුතු කරමි. | අයවිය යුතු සියලු ණයශේෂ ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වේ. |
| (ඇ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය අතර රු.84,513 ක වෙනස්කම් පැවතුණි. | වෙනසට හේතු අනාවරණය කර ගත් විගස දන්වා එවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදයෙහි සඳහන් පරිදි වෙනසට හේතු පැහැදිලි කල යුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නැටුම් ප්‍රදර්ශක තනතුරෙහි සේවය කරන නිලධාරියා 2003, සහ 2004 වර්ෂවල පිළිවෙලින් චීනය සහ කොරියාව යන රටවල විදේශ සංචාර සඳහා සහභාගි කර තිබුණු අතර විදේශ ගමන් වලට අදාල ලිපිගොනු පවත්වා ගෙන ගොස් නොතිබුණි. | විදේශ සංචාර වලට අදාළ රාජකාරී කටයුතු මෙම දෙපාර්තමේන්තුවේ කලාකරු සබඳතා අංශය වෙත 2016 වර්ෂයේදී පවරා ඇති අතර එම වසරේ සිට මේ දක්වා අදාල ගොනු එම අංශය විසින් නිසි පරිදි පවත්වා ගෙන යනු ලබයි. | විදේශ සංචාර වලට අදාල සියලු ලිපිගොනු විධිමත්ව පවත්වා ගෙන යාමට කටයුතු කල යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාජ සංරක්ෂණ දායක මුදල් වශයෙන් ආදායම් ශීර්ෂ 2004.01.00 යටතේ මධ්‍යම රජයෙන් රු.17,463,012 ක් දෙපාර්තමේන්තුවට ලැබී තිබුණද එකී ආදායම ඇස්තමේන්තු කර නොතිබුණි. | 2004.01.00 යටතේ සමාජ සංරක්ෂණ දායක මුදල්, ආදායම් ඇස්තමේන්තුවට මේ දක්වා ඇතුළත් කර නොතිබූ අතර ඉදිරි වර්ෂයේ සිට එම ආදායමද ආදායම් ඇස්තමේන්තුවට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත. | ලැබීමට නියමිත සියලු ආදායම් ඇස්තමේන්තු කිරීමට කටයුතු කල යුතු වීම. |

### 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයයන් 42 කට අදාල රු.55,744,019 ක හා මූලධන වැය විෂයයන් 11 කට අදාල රු.141,109,951 ක ප්‍රතිපාදන ඉතිරිකිරීම් කර තිබුණු අතර එම ඉතිරිකිරීම් සංශෝධිත ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 100 ක් දක්වා වූ පරාසයක් ගෙන තිබුණි. | රට තුළ පැවති කොවිඩ් 19 තත්ත්වයන් හේතුවෙන් පනවන ලද පොදු සෞඛ්‍යය නිර්ණායක මත කටයුතු කිරීමට සිදු වූ බැවින් 2020 වර්ෂයට අදාල සැලසුම්ගත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී බාධා ඇති වීම මේ සඳහා හේතු විය. | වියදම් ඇස්තමේන්තුව තාත්විකව පිළියෙල කිරීම පිළිබඳව කළමනාකරණයේ අවධානය යොමුවිය යුතු වීම. |

### 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය අනුව පුනරාවර්තන වැය විෂයයන් 11 කට අදාලව රු.1,548,821ක ශේෂයක් දක්වා තිබුණද එකී බැරකම් වලට අමතරව 2021 ජනවාරි හා පෙබරවාරි මාසවලදී 2020 වර්ෂයට අදාලව | 2020 දෙසැම්බර් 31 දින දක්වා ගිණුම් අංශය වෙත ලැබුණු බැරකම් හා ඇති කර ගත් බැදීම් බැරකම් ලේඛනයට ඇතුළත් කර ඇත. ඉන් පසුව ලද බැරකම් සඳහා මු.රෙ. 115 අනුව කටයුතු කර ඇත. | ගෙවිය යුතු සියලු අගයන් බැරකම් ප්‍රකාශයට ඇතුලත් කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | පුනරාවර්තන වැය විෂයයන් 13 යටතේ රු.4,801,039 ක් ගෙවා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල මුළු බැඳීම් හා බැරකම් රු.4,801,039 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් ටවර්හෝල් රඟහල පදනම වෙත ගෙවිය යුතු 2016 හා 2017 වර්ෂයන්ට අදාල රු.1,053,000 ක ශේෂ එම පදනමේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස දක්වා නොතිබුණි. | ටවර්හෝල් පදනම මේ වන විටත් බිල්පතක් හෝ ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් හෝ දැනුම් දීමක් හෝ කර නොමැත. | ගෙවිය යුතු සියලු අගයන් බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කල යුතු වීම. |

## 2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාමට අවශ්‍ය සියලු පියවර ක්‍රියාත්මක කරන අතර එහි සඵලදායිත්වය සෑම අවස්ථාවකදීම සමාලෝචනයක් සිදුකර පද්ධති ඵලදායිතාවය පරීක්ෂා කෙරේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය | | | |
| (i) 4.2.3 උපවගන්තිය | විශ්‍රාම ගැනීමට ආසන්න නිලධාරින් 5කට සමාලෝචිත වර්ෂයේ ආපදා ණය ලබාදීමේදී 23 වැනි පරිශිෂ්ඨයේ දැක්වෙන ආකෘතිය ප්‍රකාර ලියන ලද අවලංගු කළ නොහැකි පොරොන්දුවකට නිලධාරීන්ගෙන් අත්සන් ලබාගෙන නොතිබුණි. | විශ්‍රාම ගැනීමට ආසන්න නිලධාරීන් වර්තමානයේ ආපදා ණය ඉල්ලුම් කර හෝ ආපදා ණය ලබා දී නොමැත. විශ්‍රාම ගැනීමට ආසන්න නිලධාරීන් ආපදා ණය ගැනීමේදී 23 පරිශිෂ්ඨය සඳහා අත්සන් ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. කෙසේ නමුත් විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ආපදා ණය ශේෂ වෙතොත් පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට විශ්‍රාම වැටුප් ගෙවීමේ බලධාරියා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කල යුතු වීම. |
| (ii) 4.2.5, 4.5 හා 4.6 උපවගන්ති | වර්ෂ 05 ක් ඉක්මවූ මියගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.23,931 ක ණයශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලබාගත් ණය මුදල අයකර ගැනීමට පෙර නිලධාරියකු මියගියහොත් ඔහුගේ උරුමක්කාරයින්ට ගෙවීමට නියමිත මුදලකින් අඩුකර ගැනීමට මියගිය අයට අදාළ තොරතුරු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. | ණය මුදලක් ආපසු ගෙවා අවසන් වීමට පෙර, මියයන්නා වූ නිලධාරියෙකුගේ ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කල යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | (iii) 4.5 උපවගන්තිය හා 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PFD/RED/2015/08පොදු(i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3(ඉ) ඡේදය | වසර 05 ක් ඉක්මවා ඇති වැඩ තහනම් කල නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.36,380 ක්, හඳුනා නොගත් නිලධාරීන් පස් දෙනෙකුගෙන් අයවිය යුතු රු.23,923 ක් හා සේවය හැරගිය නිලධාරීන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු රු.82,923 ක් වූ ණය ශේෂයන් අයකර ගැනීමට විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | වැඩ තහනම් කළ හා සේවය හැරගිය නිලධාරීන්ගේ අදාළ ණය ශේෂ පාලන අංශය වෙත දැනුවත් කිරීමෙන් පසු අයකර ගැනීමට කටයුතු කරමින් පවතින අතර ඒ අය අතරින් සම්බන්ධකර ගැනීමට හැකි වූ හා ණය පියවීමට එකඟ වූ නිලධාරීන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත. | ණය මුදලක් ආපසු ගෙවා අවසන් වීමට පෙර, සේවය අවසන් වන්නා වූ හෝ වැඩ තහනම් කරනු ලබන නිලධාරියෙකුගේ ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කල යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 189 | 2018 වර්ෂයේ සිට 2020 ජනවාරි දක්වා කාලය තුල තැන්පත් කළ නිශ්කාශනය නොවූ රු.830,034 ක් වටිනා චෙක්පත් 59 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | චෙක්පත් 59 ක් නිෂ්කාශනය නොවී තිබීම සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු සෙවීම සිදු කරන අතර තොරතුරු සොයාගත් වහාම දැනුම් දීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| (ඇ) | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන චක්‍රලේඛයේ 1.1.7ඡේදය | රජයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වලට ස්ථාන මාරුවී ගිය සේවකයින් 23 දෙනෙකුට අදාල වසර 05 කට වැඩි කාලයක් තිස්සේ පවතින රු. 90,568 ක්වූ ණයශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂය තුලදී රටේ ඇති වූ අයහපත් වාතාවරණය හමුවේ අත්‍යවශ්‍ය රාජකාරීවලට ප්‍රමුඛත්වය ලබා දී කටයුතු කර ඇති බැවින් 2020 වර්ෂයේදී එම කටයුතු අවසන් කිරීමට නොහැකිවී ඇත. නමුත් 2021 වර්ෂයෙදී මෙම ණය ශේෂ අයකිරීමට හෝ පියවා ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන ලෙස විෂය භාර නිලධාරී දැනුවත් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

## 2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි 2014 වර්ෂයේ සිට පැවත එන එකතුව රු.3,040 ක් වූ ශේෂ 02 ක් හා හඳුනා නොගත් ගෙවීම් ලෙස දිගින් දිගටම දක්වා තිබූ 2018 වර්ෂය හා ඊට පෙර වර්ෂයන්ට අදාළ එකතුව රු.28,851 ක් වූ චෙක්පත් 09 ක් හඳුනාගෙන ගැලපීම් කර නොතිබුණි. | 2018 වර්ෂය හා ඊට පෙර වර්ෂයන්හි සිට පැවත එන මෙම ගෙවීම් හා චෙක්පත් පිළිබඳ නිවැරදි තොරතුරු තවමත් නොලැබී ඇති අතර එම තොරතුරු පරීක්ෂා කරමින් පවතියි. නිරවුල් කර ගත් වහාම දැනුම් දීමට කටයුතු කරමි. | හඳුනානොගත් ගෙවීම් හා චෙක්පත් නිරවුල් කර ගැනීමට කටයුතු කල යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය හා 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කල යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණිත දින වූ 2021 මැයි 31 තෙක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික කාර්ය සාධන වාර්තාව කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. | පනතේ සහ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු වීම. |

## 3.2 ප්‍රසම්පාදනයන්

ජාතික කලාභවන ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික කලාභවන ප්‍රතිසංස්කරණය සඳහා 2020 ඔක්තෝබර් 29 දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබූ අතර 2020 දෙසැම්බර් 15 දින අංක අමප/20/1760/305/010 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ගොඩනැගිල්ල නවීකරණ කටයුතු සඳහා කඩා ඉවත් කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. ඊට අදාලව තාවකාලික වහලයක් ඉදිකිරීම සහ කැඩුනු බිත්ති ඉවත් කිරීම සඳහා නාවික හමුදාව විසින් රු.8,362,898 ක වියදම් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණද මේ සඳහා වියදම උපරිම වශයෙන් රු.6,159,450 ක් (බදු රහිත) බව උපදේශන සේවා සපයන මොරටුව විශ්ව විද්‍යාලයේ වාස්තු විද්‍යා අංශය විසින් දක්වා තිබුණි. මේ අනුව, වියදම් ඇස්තමේන්තුව රු.2,203,448 කින් ඉක්මවා තිබුණද නාවික හමුදා ඇස්තමේන්තුව ප්‍රසම්පාදන කමිටුව විසින් 2020 දෙසැම්බර් 21 දින අනුමත කර තිබුණි. | ඇස්තමේන්තුව ඉක්මවූ මුදල තාවකාලික වහලය, උපකරණ හා යන්ත්‍ර සඳහා වන පිරිවැය බවත් ඉන් රු.මි.1.5 ක් සුන්බුන් වටිනාකමෙන් ආවරණය කරගත හැකි බවත් උපදේශක සේවා ආයතනය ලිපියක් දන්වා ඇති අතර ප්‍රසම්පාදන කමිටුව ඒ පිළිබඳ අවධානය යොමු කල බවට කමිටු තීරණයේ දක්වා ඇත. | මෙවැනි අනාර්ථික වියදම් වළක්වා ගැනීමට කටයුතු කල යුතු වීම. |
| (ආ) | අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මෙම කාර්ය නාවික හමුදාව වෙත පවරා තිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.1 ප්‍රකාර ලිඛිත ගිවිසුමකට එළඹීමට හා මාර්ගෝපදේශ 5.4.8 ප්‍රකාර කාර්යසාධන සුරක්ෂණයක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | නාවික හමුදාව සිදුකරන ඉදිකිරීම් කාර්යන්හිදී කිසිදු ආයතනයක් සමග ගිවිසුම්ගත නොවන බවට හා කාර්යසාධන සුරක්ෂන ඉදිරිපත් නොකරන බවට නාවික හමුදාපති 2021 අප්‍රේල් 23 දින ලිපියක් ඉදිරිපත් කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අදාල කාර්ය ආරම්භ කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.4.4 ප්‍රකාරව ලබාදිය හැකි උපරිම අත්තිකාරම රු.1,520,527 ක් වුවද රු.5,500,000 ක අත්තිකාරම් මුදලක් ලබාදී තිබූ අතර අත්තිකාරම් සුරක්ෂණයක් ලබාගෙන ද නොතිබුණි. | එම කාර්යය අමාත්‍ය මණ්ඩල අනුමැතියට යටත්ව ඍජු පදනම මත ඉටු කළ කාර්යයක් බැවින් රජයේ ආයතනයක් වන නාවික හමුදාව වෙත යෝජිත ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍ය කඩා ඉවත් කිරීම් සිදු කිරීමට වෙන් කර ඇති ප්‍රතිපාදන, අවශ්‍යතාවය අනුව මුදලින් ගෙවීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය සහ අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතියට යටත්ව ගෙවීම් සිදු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව අත්තිකාරම් සුරක්ෂණයක් මත පමණක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවිය යුතු වේ. |
| (ඈ) | කාර්ය සඳහා උපදේශක සේවාව මොරටුව විශ්වවිද්‍යාලය වෙතින් ලබාගෙන තිබූ අතර ගිවිසුමකට එළඹ නොතිබියදී මුළු උපදේශන ගාස්තුව වූ රු.1,500,000 න් සියයට 94 ක් එනම් රු.1,410,000 ක් ගෙවා තිබුණි. | උපදේශන සේවා ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කර ඇත. | උපදේශන කාර්ය සඳහා ගිවිසුම් ගත වී ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් කළ යුතු වීම. |
| (ඉ) | ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු සඳහා අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් අනුමැතිය ලබාදී තිබියදී හදිසි නඩත්තු කටයුත්තක් සේ සලකා යොදවා 2020 දෙසැම්බර් 03 දින සිට දෙසැම්බර් 19 දින දක්වා කාලය තුල රු.269,996 ක වියදමක් දරා ගොඩනැගිල්ලේ තීන්ත ආලේපන හා උද්‍යාන අලංකරණ කටයුතු සිදුකර තිබුණද 2020 දෙසැම්බර් 31 දින වනවිට ගොඩනැගිල්ල කඩා ඉවත්කර තිබූ බැවින් රු.269,996 ක වියදම නිශ්කාර්ය වියදමක් විය. | ජාතික කලාභවන ගොඩනැගිල්ලේ තීන්ත ආලේපන හා උද්‍යාන අලංකරණ කටයුතු සිදුකරන ලෙස සංස්කෘතික අධ්‍යක්ෂගේ 2020/12/01 දිනැති සටහනට අනුව කටයුතු සිදුකරන ලද අතර ඒ වන විට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී නොමැති බැවින් අදාළ ගොඩනැගිල්ල කඩිනමින් ම කඩා ඉවත් කර ගැනීමට සිදුවන බව ඒ අවස්ථාව වන විට නොදැන සිටින ලදී. | මෙවැනි නිශ්කාර්ය වියදම් වලක්වා ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | ජාතික කලාභවන ප්‍රතිසංස්කරණ කාර්ය සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මගින් ප්‍රසම්පාදන කටයුතු ඉටුකර තිබුණ ද මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබීම හේතුවෙන් අදාල ප්‍රසම්පාදන අධිකාරිය මාර්ගෝපදේශ 2.14.1 ට අනුකූල ද යන්න තහවුරු නොවූ අතර මාර්ගෝපදේශ 2.8.1 ප්‍රකාරව තාක්ෂණ ඇගයීම් කමිටුවක් ද පත්කර නොතිබුණි. | මුළු පිරිවැය ඇස්තමේන්තුවට අදාල අධිකාරී සීමාව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව යටතට ගැනෙන බැවින් ඒ මත පිහිටා කටයුතු කර ඇත. මෙම ප්‍රතිසංස්කරණ කාර්යයෙහි පළමු අදියර ලෙස අවශ්‍ය මූලික කඩා ඉවත් කිරීම් සඳහා මිල ගණන් වාර්තාවක් ලබා ගන්නා ලද්දේ මීට පෙර ජාතික තරඟකාරී ලංසු ක්‍රමවේදය යටතේ මිල කැඳවීමට සකස් කර තාක්ෂණික ඇගයීම් කමිටුව සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලද ප්‍රමාණ පත්‍රය (BOQ) මත පදනම්ව වේ. මූලික කඩා ඉවත් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කාර්ය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීමට හා තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත්කිරීමට කටයුතු කල යුතු වේ. |

කිරීමේදී පූර්ණ වශයෙන් වාස්තු විද්‍යාත්මක උපදේශන සේවා සහාය මොරටුව විශ්ව විද්‍යාලයේ වාස්තු විද්‍යා උපදේශන සේවා ඒකකය වෙතින් ලබා දෙනු ලබන බැවින් සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියට යටත්ව සෘජු පදනම මත රාජ්‍ය ආයතනයක් වෙතින් සිදු කෙරෙන ඉදිකිරීම් කාර්යයක් වන බැවින් තාක්ෂණික ඇගයීම් කමිටු සහාය ලබා ගැනීම අත්‍යාවශ්‍ය නොවේ.

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සතු හෙක්ටයාර 3.6517 ක්වූ ඉඩම් 05 ක හිමිකම සනාථ කිරීම සඳහා කිසිදු ලේඛනයක් දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණ අතර ඉඩම්වල අයිතිය පවරාගැනීමට අවශ්‍ය පියවර ගෙනද නොතිබුණි. | හෙක්ටයාර 3.2701 ක් වූ ඉඩම් 03 ක අයිතිය සම්බන්ධයෙන් තොරතුරු නොමැත. හෙක්ටයාර 0.3816 ක් වූ ඉඩම් 02 ක් පවරා ගැනීමට පියවර ගනිමින් පවතී. | දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතු වේ. |
| (ආ) | දෙපාර්තමේන්තුව සතු අංක 41 ශ්‍රී 9416 දරන ලොරි රථය සංස්කෘතික, ආගමික හා බෞද්ධ කටයුතු අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණද නීත්‍යානුකූලව පවරා නොතිබුණි. | සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම පරිදි රාජකාරී සඳහා අංක 41 ශ්‍රී 9416 දරන ලොරි රථය තාවකාලික පදනම මත ලබා දී විධිමත් පරිදි පවරා දීමට අවශ්‍ය කටයුතු කර ඇත. | වාහන මෙම ආයතන වෙත පැවරීමේදී නීත්‍යානුකූලව පවරාදීමට කටයුතු කල යුතු වේ. |

## 3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 සිට 893 දක්වා රෙගුලාසි සහ 612 වැනි අධිකාරිය මත වූ රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් 52 ක් හඳුනාගෙන තිබුණද එම නිලධාරීන් වෙතින් ඇප ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඇති අතර 2019 නොවැම්බර් 25 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 07/2019 අනුව ඇප තැබිය යුතු ප්‍රමාණය හා ඇප තැබිය යුතු ආකාරය පිළිබඳව අමාත්‍යාංශ ලේකම් වෙතින් උපදෙස් ලබාගැනීමට 2020 ජුලි 24 දින යොමු කර ඇත. උපදෙස් ලැබුණු පසු ඒ අනුව අයකිරීම් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | විධිවිධාන ප්‍රකාරව ඇප තැබිය යුතු නිලදාරීන් වෙතින් ඇප ලබාගැනීමට කටයුතු කල යුතු වීම. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර 2011 වර්ෂයේ අනුමත කරන ලද අභ්‍යන්තර විගණක තනතුර පිරවීමට 2021 මැයි වනවිටත් කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිලධාරීන් දෙපාර්තමේන්තුවට බඳවා ගත නොහැකි වන අතර එම තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගෙන අනුයුක්ත කරනුයේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගිනි. 2016 වසරේ සිට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත වරින් වර අභ්‍යන්තර නිලධාරියකු අනුයුක්ත කර දෙන ලෙස ඉල්ලීම් ලිපි යොමුකර ඇත. | අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ගැනීමට හා අභ්‍යන්තර විගණනයන් සිදුකිරීමට කඩිනමින් පියවර ගත යුතු වේ. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 850 ක් වූ සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 125 ක් එනම් සියයට 15 ක් පුරප්පාඩුවී පවතුනු අතර ඒ තුල 28 ක්වූ ජ්‍යෙෂ්ඨ මට්ටමේ කාර්ය මණ්ඩලයෙන් 12 ක් එනම් සියයට 43 ක්වූ පුරප්පාඩු ද විය. | කර්තෘ තනතුරු 2 සහකාර කර්තෘ, නියෝජ්‍ය කර්තෘ තනතුරු වල උසස් වීමක් වන අතර ඒ සඳහා බාහිරින් බඳවා ගත නොහැක. සහකාර කර්තෘ තනතුරු 7 බඳවා ගැනීමට අදාළ විභාගය විභාග දෙපාර්තමේන්තුව මඟින් 2021 ජූනි මස පැවැත්වීමට නියමිතය. තවද ගණකාධිකාරී, අභ්‍යන්තර විගණක හා සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් සිදු කරන අතර අදාළ නිලධාරීන් අනුයුක්ත කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත. | අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පවතින තනතුරු ඉක්මනින් පිරවීමට අවශ්‍ය පියවර ගත යුතු වේ. |